# ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සම්බන්ධ නීතිමය පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

**එස්.එම්. තුෂාර නලින්ද සේනානායක ***

නීතිය සැමට එක වූවා සේම පොදු විය යුතු ය. ලෝකයේ සෑම රාජ්‍යයකම පාහේ නීතිමය සංකල්ප ප්‍රායෝගික තලය තුළදී එලෙසින්ම ක්‍රියාත්මක වුවත්, ශ්‍රී ලංකාව තුළ යම් යම් දුෂ්කරතා මධ්‍යයෙහි එකී සංකල්ප ක්‍රියාත්මක වෙමින් පවතී. යුරෝපයේ සත්ත්ව හිංසනය සහ සතුන් ආරක්ෂා කිරීම වෙනුවෙන් නීතිමය රාමු ගොඩනැගීමත්, විවිධ රාජ්‍ය ආයතනත්, විවිධ රාජ්‍ය නොවන සංවිධාන ආරම්භ කර තිබීමත් දැකිය හැකිය. නමුත් ශ්‍රී ලංකාවේ වන සතුන් ආරක්ෂා කිරීම වෙනුවෙන් ඉදිරිපත් වන සංවිධාන සහ නීතිමය තත්ත්වයන්හි මන්දගාමීත්වයක් දැකිය හැකිය. මෙම අධ්‍යයනය මගින් සෘජුව අධ්‍යයනය කිරීමේහි අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සම්බන්ධ නීතිමය තත්ත්වයන් සහ අලි ඇතුන් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ගෙන ඇති ප්‍රතිපත්ති පිළිබඳව අධ්‍යයනය කිරීමය. සමස්තයක් වශයෙන් 2012 වර්ෂයේ සිට 2015 දක්වා වූ වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සම්බන්ධයෙන් විවිධ ගැටලු සහගත තත්ත්වයන් සහ භාරකාරත්වයන් මෙන්ම ව්‍යාජ ලේඛන මගින් අලි ඇතුන් පුද්ගල සන්තකයේ තබාගැනීම වැනි සිදුවීම් බහුල වශයෙන් සිදුවිය. ඒ කෙරෙහි නීතිමය බලාත්මක වීම අවම මට්ටමක පැවතීම මෙවැනි අධ්‍යයනයක් සිදු කිරීමට හේතු වූ ප්‍රමුඛ ගැටලුව විය. විශේෂයෙන් මෙවැනි සපරාධි ක්‍රියාවන්ට සම්බන්ධ පුද්ගලයින් හට නීතිමය පියවර ගැනීමේදී වනජීවී පනත් සහ සාමන්‍ය නීති ක්‍රියාත්මක කළ යුත්තේද? යන්නත් අධ්‍යයනය කිරීම වැදගත් කොට සැලකිය යුතුය. විශේෂයෙන් අලි ඇතුන් ජාවාරම, කැලයෙන් නීති විරෝධී ලෙස අලි පැටවුන් අල්ලා අලෙවි කිරීම වැනි ක්‍රියාවන් සඳහා ලබාදෙන නීතිමය දඬුවම් පිළිබඳව මෙහිදී අධ්‍යයනය කරනු ලැබේ. එසේම ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සම්බන්ධව පවතින නීතිමය රාමු තුළ ඇති දුර්වලතා සහ නව සංශෝධන සිදු කළ යුතු ආකාරය පිළිබඳව ද අධ්‍යයනය කරනු ලැබේ. මේ සඳහා දැනට ශ්‍රී ලංකාවේ අලි අතුන් සම්බන්ධ නඩු විභාගයන් පිළිබඳව දත්ත රැස් කොට ඒවායෙහි අඩු ලුහුඬුකම් නිරීක්ෂණය කරන ලදී. ද්වීතීක දත්ත රැස් කිරීමක් වශයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නීතිමය පනත් සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් සම්පාදිත නීතිමය අණ පනත් අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යනයේදී අනාවරණය වූයේ ශ්‍රී ලංකාවේ අලි අතුන් සම්බන්ධ නීතිමය තත්ත්වයන් දේශපාලන අධිකාරියට යටත්ව ක්‍රියාත්මක වීමත්, නීතිමය පනත් තුළ දුෂ්කරතා පැවතීමත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ නීතිරීති තුළ විවිධ අඩු ලුහුඬුකම් පවතින බවත්ය. එමගින් ශ්‍රී ලංකාවේ වඳ වීමේ තර්ජනයට ලක්ව ඇති අලි ඇතුන් ගහණයේ ප්‍රමාණාත්මක අඩු වීමකට මූලික හේතු සාධක වී ඇති බවත් පැහැදිලි විය.

**මුඛ්‍ය පද: අලි ඇතුන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව, නීති සහ පනත්**

---

***පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.**